ප්‍රශ්න පත්‍ර සඳහා පිවිසෙන්න.
http://iscolee.blogspot.com/

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# දෙවන වාර පරීක්ෂණය 2019

| 6 ශ්‍රේණිය | ගණිතය | 1205 | පැය දෙකයි |
|---|---|---|---|

නම/විභාග අංකයඃ- .............................................. පන්තියඃ-................

**වැදගත්**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 6 කින් සමන්විතය.
- ඔබේ **නම /විභාග අංකය** නිවැරදිව ලියන්න.
- **I කොටසෙහි** ප්‍රශ්න **සියල්ලට ම** මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න. පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නයට යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- **II කොටසෙන් ප්‍රශ්න 6 ක්** තෝරාගත යුතු අතර, ඒ සඳහා ඔබ විසින් සපයාගත් කඩදාසිවල පිළිතුරු සපයන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **අදාල පියවර** හා **නිවැරදි ඒකක** දැක්වීම අත්‍යවශ්‍යය.
- පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

**I කොටසෙහි**
අංක 1 - 20 තෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින්

**II කොටසෙහි**
එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| ප්‍රශ්න අංකය | | ලකුණු |
|---|---|---|
| I කොටස | 1 - 20 | |
| II කොටස | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| | 7 | |
| මුළු එකතුව | | |

| | |
|---|---|
| ........................ ලකුණු කළේ | ............... සංකේත අංකය |
| ........................ පරීක්ෂා කළේ | ............... සංකේත අංකය |


( දෙවන පිටුව බලන්න.)

## I කොටස

ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න

**1.** පැන්සල් 3 ක මිල රුපියල් 36 කි. පැන්සල් 5 ක මිල සොයන්න.


පැන්සල් 1 ක මිල = ......................

පැන්සල් 5 ක මිල = ......................

**2.** පහත රූපයේ දී ඇති තොරතුරු අනුව හිස්තැනට අදාල අක්ෂරය ලියන්න.

(i) ........... වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයකි.


(ii) ........... වෘත්තය ඇතුළත පිහිටි ලක්ෂ්‍යයකි.




**3.** 4 032 සංඛ්‍යාව,


(i) ගණක රාමුවේ නිරූපණය කරන්න.

(ii) සංඛ්‍යාවේ 3 ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න





**4.** රූපවල අඳුරු කළ කොටස භාගයක් ලෙස දක්වන්න.

(i)



...........

(ii)



...........

**5.** නිවැරදි වරණය යටින් ඉරක් අඳින්න. 3 290 යන සංඛ්‍යාව,

(i) 2 න් පමණක් ඉතිරි නැතිව බෙදේ.

(ii) 5 න් පමණක් ඉතිරි නැතිව බෙදේ.

(iii) 10 න් හා 5 න් පමණක් ඉතිරි නැතිව බෙදේ.

(iv) 2 න් , 5 න් හා 10 න් ඉතිරි නැතිව බෙදේ.

**6.** භාගේශ්වරී 1 m 50 cm දිග රිබන් පටියකින් 80 cm දිග කැබැල්ලක් කපා ගත්තාය. ඉතිරි කැබැල්ලේ දිග සොයන්න.

රිබන් පටියේ දිග = 1 $m$ 50 $cm$ = ............$cm$


කපා ගත් කැබැල්ලේ දිග = ............$cm$

ඉතිරි කැබැල්ලේ දිග = ............$cm$

7. ඔබගේ නිවසේ දක්නට ලැබෙන ඝනකාභ හැඩැති වස්තු දෙකක් නම් කරන්න.

.................................... ......................................

8. (i) රූපයේ දැක්වෙන්නේ පොත් රාක්කයකි. එහි එක් කොටසක ඇසිරිය හැකි පොත් ගණන දක්වා ඇත. සෑම කොටසකම ඇසිරිය හැකි පොත් ගණන සමාන නම් මුළු රාක්කයේම ඇසිරිය හැකි පොත් ගණන නිමානය කරන්න.




(ii) නිමල්ගේ බර 48 kg වේ. නිමල්ගේ බර ආසන්න 10 ට වටයන්න.

9. ( +2 ) > ......... > .......... හිස්තැන්වලට ගැලපෙන අගයන් වරහන් තුලින් තෝරා ලියන්න.

( -6 , +2 , 0 , +4 )

10. පහත තල රූප හඳුන්වන විශේෂිත නම රූපයට පහළින් දක්වා ඇති කඩ ඉර මත ලියන්න.



.............................. ..............................

11. හිස් කොටුවලට ගැලපෙන ඉලක්කම් ලියන්න.

$$\begin{array}{r} \square\ 4 \\ +\ 2\ \ 9 \\ \hline 8\ \square \\ \hline \end{array}$$

12. සාරා පෙ.ව. 9.55 ට ගණිත ගැටළුවක් විසඳීමට ආරම්භ කළ අතර පෙ.ව. 10.17 ට එය අවසන් කළාය. ඇයට ගණිත ගැටළුව විසඳීමට ගතවූ කාලය සොයන්න.

13. 350054417 සංඛ්‍යාව,

(i) කලාප වලට වෙන් කර ලියන්න. ............. ............. ..............

(ii) එහි සංඛ්‍යා නාමය ලියන්න. ........................................




( හතරවන පිටුව බලන්න.)

14. 1 , 5 , 2 , 7 යන ඉලක්කම් එක් වරක් පමණක් භාවිතයෙන් ලිවිය හැකි ඉලක්කම් 4කින් යුත්

(i) විශාලතම සංඛ්‍යාව ලියන්න. ………………………………

(ii) කුඩාතම සංඛ්‍යාව ලියන්න. ………………………………

15. රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රාකාර මල් පාත්තියේ දිග 3 m ද පලල 1 m ද වේ. මල් පාත්තියේ පරිමිතිය සොයන්න.




16. 1 ත් 15 ත් අතර ප්‍රථමක සංඛ්‍යා, අසම්පූර්ණ ලෙස පහත දක්වා ඇත. හිස්තැන් වලට අදාල ප්‍රථමක සංඛ්‍යා දෙක ලියන්න.

2 , 3 , 5 , ……. , ……..,13

17. 1.0 , 1.01 , 0.11 , 1.11 යන දශම සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සකස් කර ලියන්න.

18. (i) $\frac{72}{100}$ ; දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(ii) 0.8 ; භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

19. හිස්තැන්වලට ගැලපෙන ගණිත කර්ම යොදන්න.

7 …….. 2 …….3 = 8

20. 35 හි සියළුම සාධකවල ඓක්‍යය සොයන්න.

6 ශ්‍රේණිය

## II කොටස

ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** *(a)* පහත වගුවේ දක්වා ඇත්තේ 1 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය තෙක් පන්ති සහිත විදුහලක ශිෂ්‍ය සංඛ්‍යාවයි.

| අංශය | පිරිමි ළමුන් සංඛ්‍යාව | ගැහැනු ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| ප්‍රාථමික (1-5) | 247 | 295 |
| කණිෂ්ට (6-9) | 187 | 169 |

(i) විදුහලේ සිටින ගැහැනු ළමුන් සංඛ්‍යාව සොයන්න.

(ii) ප්‍රාථමික අංශයේ පිරිමි ළමුන්ට වඩා ගැහැනු ළමුන් කොපමණ සංඛ්‍යාවක් සිටීදැයි සොයන්න.

(iii) ප්‍රාථමික අංශයේ සියළුම සිසුන් සඳහා එක් සිසුවෙකුට පැන්සල් 5 බැගින් ලබා දීමට අවශ්‍ය පැන්සල් සංඛ්‍යාව සොයන්න.

*(b)* සුළු කරන්න $3024 \div 12$

**2.** (i) පහත දී ඇති එක් එක් සරල රේඛීය තල රූපවල මුහුණතක හැඩය ලෙස දැකිය හැකි ඝන වස්තුවක් බැගින් ලියා දක්වන්න.


*(a)* සෘජුකෝණාස්‍රය *(b)* සමචතුරස්‍රය *(c)* ත්‍රිකෝණය

(ii) සවිධි චතුස්තලයක පතරොමක් හා ආකෘතියක් පහත දැක්වේ. චතුස්තලයේ දාර ගණන ලියන්න



(iii) මෙවැනි චතුස්තල දෙකක් මුහුණතකින් ඇලවීමෙන් ලැබෙන ඝන වස්තුවේ මුහුණත් ගණන කීයද?

**3.** A සිට I තෙක් යාම සඳහා වූ ගමන් මාර්ගයේ සටහනක් පහත රූපයේ දක්වා ඇත.




ඉහත සටහන භාවිතයෙන් පහත වගු සම්පූර්ණ කරන්න.

| ගමන් මාර්ගය | දිශාව |
|---|---|
| Aසිට B තෙක් | |
| Bසිට C තෙක් | |
| Cසිට D තෙක් | |
| Eසිට F තෙක් | |
| Gසිට I තෙක් | |

| කෝණයේ අංකය | කෝණ වර්ගය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

**4.** 1 සිට 25 තෙක් වූ පූර්ණ සංඛ්‍යා අතරින්,

(i) 3 හි විශාලතම ගුණාකාරය කීයද?

(ii) සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ලම ලියන්න.

(iii) කුඩාතම හා විශාලතම ත්‍රිකෝණ සංඛ්‍යා දෙක ලියන්න


(iv) " අනුයාත (එක ළඟ පිහිටි) ත්‍රිකෝණ සංඛ්‍යා දෙකක් එකතු කල විට සමචතුරස්‍ර සංඛ්‍යාවක් ලැබේ."
ඒ අනුව හිස්තැන් වලට අදාල ත්‍රිකෝණ සංඛ්‍යා ලියන්න

……….. + ………. = 16

(v) 50 ට අඩු පූර්ණ සංඛ්‍යා අතර ඉරට්ටේ සංඛ්‍යාවක් ද, ත්‍රිකෝණ සංඛ්‍යාවක් ද සමචතුරස්‍ර සංඛ්‍යාවක් ද වන සංඛ්‍යාව ලියන්න.

**5.** (*a*) (- 3), 0, 5 යන සංඛ්‍යා, සංඛ්‍යා රේඛාවක් මත නිරූපණය කරන්න.

(*b*) සතියක වැඩ කරන දින පහක් තුළදී ග්‍රාමීය රෝහලකට බෙහෙත් ගැනීමට පැමිණි රෝගීන් සංඛ්‍යා පහත සංඛ්‍යා රේඛාවේ නිරූපණය කර ඇත.




| සඳුදා - A, අඟහරුවාදා - B, බදාදා – C බ්‍රහස්පතින්දා – D, සිකුරාදා – E |
|---|

(i) අඟහරුවාදා දින රෝහලට පැමිණි රෝගීන් සංඛ්‍යාව කීයද?

(ii) රෝගීන් 55 දෙනෙක් පැමිණියේ කුමන දවසේ ද?

(iii) බදාදා දින පැමිණි රෝගීන් සංඛ්‍යාවට වඩා බ්‍රහස්පතින්දා පැමිණි රෝගීන් සංඛ්‍යාව කීයද?

(iv) මෙම සතියේ දින පහ තුළදී රෝහලට බෙහෙත් ගැනීමට පැමිණි මුළු රෝගීන් සංඛ්‍යාව සොයන්න.

**6.** (*a*) පහත සඳහන් මිනුම් ලබා ගැනීම සඳහා වඩාත් යෝග්‍ය මිනුම් ඒකක ලියන්න.

(i) මහනුවර සිට කොළඹ නගරයට ඇති දුර

(ii) පැන්සලක දිග

(iii) ළිඳක ගැඹුර

(*b*) A භාජනයෙහි ජලය 1 *l* 300 *ml* ඇත. B භාජනය සම්පූර්ණයෙන්ම පිරවීම සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය 800 *ml* වන අතර C භාජනය සම්පූර්ණයෙන්ම පිරවීම සඳහා ජලය 725 *ml* අවශ්‍ය වේ.

(i) B සහ C භාජන දෙකෙහි අල්ලන මුළු ජල ප්‍රමාණය සොයන්න

(ii) B සහ C භාජන සම්පූර්ණයෙන්ම පිරවීම සඳහා A භාජනයෙහි ඇති ජල ප්‍රමාණයට අමතරව තව කොපමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය වේද?

**7.** (i) පහත දී ඇති භාග ආරෝහණ පිළිවෙලට සකස් කර ලියන්න. $\frac{1}{5}$ , $\frac{1}{7}$ , $\frac{1}{3}$

(ii) හිස් තැන්වලට ගැලපෙන අගයන් ලියන්න. $\frac{2}{7} = \frac{2\times3}{7\times\ldots} = \frac{\ldots\ldots}{\ldots\ldots}$

(iii) සුළු කරන්න. $\frac{1}{2} - \frac{1}{8}$

(iv) මිනිසෙකු තමා සතු ඉඩමෙන් $\frac{3}{10}$ ක් විකුණූ අතර $\frac{1}{5}$ ක් තම පුතුට දුන්නේය. ඔහු විකුණූ හා පුතුට දෙනලද කොටස්වල එකතුව සොයන්න.

* * *